# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2183/37 – 2020 ජූලි 09 වැනි බ්‍රහස්පතින්දා – 2020.07.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2016/149.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2018.08.09 වැනි දින අංක 2083/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2018.07.30 වැනි දින දරන නියෝගයෙන්,

එච්. කේ. නිමල් මයා., ආර්. ජී. 4, සොයිසා පුර, මොරටුව.

සහ

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, අංක 130, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02.

අතර පවත්නා 2018.07.25 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම්කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ඕබඩගේ ලීලාරත්න මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2018.07.30 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

දිනේෂ් ගුණවර්ධන,
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය.

2020 මාර්තු මස 13 වැනි දින,
කොළඹ දී ය.

07 – 654/1

1A – G32461 – 26 (2020/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/04/2016/149.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එච්. කේ. නිමල් මයා., ආර්. ජී. 4, සොයිසාපුර, මොරටුව.

සහ

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, අංක 130, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කළුතර, නාගොඩ, ශ්‍රී සෝභිත මාවත, අංක 242, ඕබඩගේ ලීලාරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය.

2020 මාර්තු මස 13 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2016/149.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එච්. කේ. නිමල් මයා., ආර්. ජී. 4, සොයිසාපුර, මොරටුව.

සහ

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, අංක 130, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''1981 වර්ෂයේ ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ පරිගණක ක්‍රියාකරුවකු ලෙස සේවයට බැඳී, දැනට ක්‍රම සහකාර ලෙස සේවය කරන එච්. කේ. නිමල් මයාට 1996 වර්ෂයේ සිට ක්‍රම විග්‍රාහක/වැඩසටහන් සම්පාදක තනතුර හා එයට අදාළ හිඟ වැටුප් අතිකාල හා අනෙකුත් දීමනා ලබා නොදීම, 2006.01.01 දින සිට පරිගණක දත්ත සුපරීක්ෂක තනතුරේ වැඩ ආවරණය කිරීම වෙනුවෙන් ලැබිය යුතු දීමනාව ලබානොදීම හා 1991 වැටුප් සංශෝධන මඟින් වැටුප රු. 15/-ක් අඩුකර ගෙවීම මඟින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 පෙබරවාරි මස 02 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 – 654/2

මගේ අංකය: IR/COM/05/2017/180.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එස්. ලියනගේ මිය., E 1/A 12, ටෙලිකොම් අසල, මහවැලි කඳවුර, අගුණකොළපැලැස්ස.

සහ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, හෝකන්දර උතුර, අරංගල, රණමයුර මාවත, 453 එෆ්, වී. ජයරත්න මයා. පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය.

2020 මාර්තු මස 11 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/05/2017/180.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එස්. ලියනගේ මිය., E 1/A 12, ටෙලිකොම් අසල, මහවැලි කඳවුර, අගුණකොළපැලැස්ස.

සහ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ** වනුයේ,

''ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පරිපාලන නිලධාරිනියක ලෙස සේවය කරන එස්. ලියනගේ මහත්මිය විසින් ලිපිකරු II ශ්‍රේණිය, ලිපිකරු I ශ්‍රේණිය පාලන සහකාර හා පරිපාලන නිලධාරී තනතුරු පෙරදාතම කරන ලෙසත්, සහකාර අධ්‍යක්ෂ (පිරිස්) නියෝජ්‍ය අධ්‍යක්ෂ (පිරිස්), අධ්‍යක්ෂ (පිරිස්) යන තනතුරු සුදුසුකම් සළකා ලබාදෙන ලෙසත් ඒ අනුව හිඟ වැටුප් හා අදාළ දීමනා ලබා දෙන ලෙසත් කරනු ලබන ඉල්ලීම සාධාරණ හා යුක්ති සහගත වන්නේ ද? එසේ නම් ඇයට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 දෙසැම්බර් මස 30 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 – 655

මගේ අංකය: IR/COM/03/2018/273.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල් වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණා පිළිබඳව –

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 259/9, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම.
(අයි. පී. ශාන්ත නිමල්රත්න මයා. වෙනුවෙන්).

සහ

ලංකා ටයිල්ස් පීඑල්සී, අංක 215, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ගාල්ල, කොහොම්බන් වත්ත, අංක 66/2 ඒ, එච්. ආර්. එල්. සුගතදාස මයා. පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය.

2020 අප්‍රේල් මස 03 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2018/273.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 259/9, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම.
(අයි. පී. ශාන්ත නිමල්රත්න මයා. වෙනුවෙන්).

සහ

ලංකා ටයිල්ස් පීඑල්සී, අංක 215, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ලංකා ටයිල්ස් පීඑල්සී ආයතනයේ රාජගිරිය ගබඩාවේ සේවය කරමින් සිටි අයි. පී. ශාන්ත නිමල්රත්න නමැති සේවකයා 2018 වර්ෂයේ දී මීරිගම, ගොඩ මැටි ශුද්ධාගාරය වෙත ද, පසුව බැලුම්මහර පිහිටි සේවා ස්ථානයට ද, නැවතත් මීරිගම, ගොඩ මැටි ශුද්ධාගාරය වෙත ද ස්ථානමාරු කිරීමෙන් එම සේවකයාට අසාධාරණයක් සිදුවී තිබේ ද? සිදුවී ඇත්නම් හිමිවිය යුතු සහන කවරේ ද?'' යන්න පිළිබඳව වේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 දෙසැම්බර් මස 31 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 – 656

මගේ අංකය: IR/COM/02/2017/42.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

ආර්. ඒ. ඩී. ඩී. රූපසිංහ මයා., අංක 336, ජල්තර, රණාල.

සහ

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, අංක 17, වික්ටෝරියා පෙදෙස, ඇල්විටිගල මාවත, කොළඹ 08.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කැලණිය, දළුගම, පරණ නුවර පාර, අංක 123/6, එම්. ඊ. ජී. සමරවීර මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය.

2020 අප්‍රේල් මස 20 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2017/42.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ආර්. ඒ. ඩී. ඩී. රූපසිංහ මයා., අංක 336, ජල්තර, රණාල.

සහ

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, අංක 17, වික්ටෝරියා පෙදෙස, ඇල්විටිගල මාවත, කොළඹ 08.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කළ ආර්. ඒ. ඩී. ඩී. රූපසිංහ මහතාට,
1. ගෙවන ලද වැටුපෙහි විෂමතාවයන් තිබේ ද? යන්නත්,
2. ජ්‍යෙෂ්ඨත්වය අහිමි කිරීමක් කර තිබේ ද? යන්නත්, එමගින් ඔහුට අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනය කවරේ ද? යන්නත් පිළිබඳව වේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 දෙසැම්බර් මස 26 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 – 657

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.